ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

# 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

**2023 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ හා සේවා සම්පාදනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පිළිගත් සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා උපදේශක සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ**

**කාණ්ඩ අංකය**

**01. යන්ත්‍ර උපකරණ කාර්යාලීය උපකරණ හා සවිකිරීම්**

- 1.1 වායුසමන යන්ත්‍ර
- 1.2 CCTV පද්ධති
- 1.3. ආරක්ෂක සංඥ පද්ධති

**02. අලෙවිකරණ කටයුතු**

- 2.1 නාම පුවරු මොනපෝල් හා පයිලෝන් (Monopol / Pylon)
- 2.2 ශාඛා සන්නාමකරණ කටයුතු (Branding)
- 2.3. Digital Flex සහ Sticker මුද්‍රණ කටයුතු (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

**03. මුද්‍රණ කටයුතු**

- 3.1 සියලුම වර්ගයේ ලිපි කවර
- 3.2 සියලුම වර්ගයේ ආකෘති පත්‍ර, රෙජිස්ට්‍රර් වර්ග හා පොත්පත්
- 3.3 සියලුම වර්ගයේ ප්‍රචාරක පත්‍රිකා
- 3.4 පාස් පොත්
- 3.5 ආරක්ෂිත මුද්‍රණ කටයුතු (ස්ථිර තැන්පත් සහතික හා PIN Mailer)
- 3.6 පරිගණක පත්‍රිකා මුද්‍රණය (Continue Sheet)

**04. මිශ්‍ර අයිතම** (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

- 4.1 සියලුම ලිපි ද්‍රව්‍ය හා සුළු උපකරණ
- 4.2 මුද්‍රණ කාට්‍රිජ් රිබන් හා ටෝනර්
- 4.3 පරිගණක ලිපි ද්‍රව්‍ය (Black light අත්සන් පත්‍රිකා සහ කාබනයිස් හා තර්මල් පත්‍රිකා – (ATM, CDM, Plam top)
- 4.4 ප්ලාස්ටික් කවර (පාස් පොත් කවර / ATM කාඩ්පත් කවර)
- 4.5 කෘමි සතුන් පාලනය හා මර්දනය
- 4.6 පානීය ජල බෝතල් සැපයීම (19l බෝතල් සහ අතිකුත්)

**05. ඉදිකිරීම් හා කොන්ත්‍රාත්**

- 5.1 ගොඩනැගිලි
- 5.2 ඇලුමිනියම් හා වැඩ නිමාවන්
- 5.3 ශාඛා අභ්‍යන්තර සැකසුම්
- 5.4 ජාල රැහැන්ගත කිරීම (Networking) / විදුලි රැහැන්ගත කිරීම (Electrical Wiring)

**06. වෙනත් සේවා** (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

- 6.1 මෝටර් රථ වාහන අලුත්වැඩියාව
  - 6.1.1 යාන්ත්‍රික අලුත්වැඩියාව
  - 6.1.2 විදුලිමය අලුත්වැඩියාව
  - 6.1.3 ටින්කරින් හා ස්ප්‍රේ පේන්ටින්
- 6.2. වාහන නඩත්තු හා සේවා කිරීම්
- 6.3 වායු සමන යන්ත්‍ර නඩත්තු හා සේවා
- 6.4 CCTV නඩත්තු හා සේවා
- 6.5 ආරක්ෂක සංඥ පද්ධති අලුත්වැඩියාව
- 6.6 නාම පුවරු මොනපෝල් අලුත්වැඩියාව

**සැලකිය යුතුය :-**

කොන්ත්‍රාත් සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA / පෙර ICTAD හෝ ජාතික ඉදිකිරීම් ආයතනය NCASL) ඒ ඒ ක්ෂේත්‍රයට අදාළව වලංගු ලියාපදිංචිය ලබා තිබීම හා වලංගු ව්‍යාපාර ලියාපදිංචිය සමග එය අඛණ්ඩ ආසන්නම පෙර වසර තුන සඳහා තිබිය යුතුය.

**කොන්දේසි හා නියමයන්**

**සියලුම අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය.**

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් / කොන්ත්‍රාත්කරුවන් වියයුතු අතර ව්‍යාපාරික ලිපිනයේ දුරකථන ෆැක්ස් සහ ඊමේල් පහසුකම් තිබීම වඩාත් යෝග්‍ය වේ. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

02. කොන්ත්‍රාත්කරුවන් සඳහා වලංගු CIDA හෝ (NCASL) ලියාපදිංචිය තිබිය යුතුය. (කලින් ICTAD ආයතනය)

03. ජාතික මට්ටමේ අයදුම්කරුවන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, පිළිගත් පෞද්ගලික ව්‍යාපාරික ආයතනවලින් පසුගිය වසර 03 දී මෙබඳු ඇණවුම් ලබා සතුටුදායක සැපයුම් හා සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

04. යන්ත්‍ර හා උපකරණ වැනි අලුත්වැඩියාවන් සහිත අයිතමයන් සැපයීමට බලාපොරොත්තු වන සැපයුම්කරුවන් අදාළ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අවස්ථාවලදී කර්මාන්තශාලා පහසුකම් තමන් සතු අය විය යුතුය.

05. අයදුම්කරුවන් වරකට රු.500,000.00 ක් ඉක්මවන ඇණවුම් සැපයීමට බලාපොරොත්තු වන්නේ නම් ඊට අවශ්‍ය මූල්‍යමය හා අනෙකුත් සම්පත් ඇති බවට ලිඛිත සාධක පෙන්නුම් කළ යුතු අතර, පසුගිය වර්ෂ තුනෙහි (2019, 2020, 2021) විගණනය කරන ලද මූල්‍ය වාර්තාවල ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් **අපගේ** www.rdb.lk **වෙබ් අඩවිය තුළින් බාගත කර** ගැනීමේ පහසුකම අයදුම්කරුවන් වෙත සලසා ඇත. හඳුන්වා දී ඇති මෙම ආකෘතිපත්‍රය මඟින් පමණක් අයදුම් කළ යුතු අතර, එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

07. එක් කාණ්ඩයක් යටතේ ඇති අනු කාණ්ඩ සඳහා එක් අයදුම්පතක් මඟින් අයදුම් කළ හැකි අතර, **සෑම ප්‍රධාන කාණ්ඩයක් සඳහාම වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා ආපසු නොගෙවන රු. 1,000.00 බැගින් (SSCL + VAT) (ප්‍රධාන කාණ්ඩ 06 සඳහා වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතුය) ලියාපදිංචි ගාස්තුවක් අයදුම්පත් බාර දීමේදී මුදලින් ගෙවිය යුතුය.**

08. **සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022/11/28 දින හෝ එදිනට පෙර ප්‍රධාන මානව සම්පත් නිලධාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය, නො. 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය වෙත හෝ මධ්‍යම, ඌව, සබරගමුව, නැගෙනහිර, වයඹ, උතුරු මැද, බස්නාහිර හා දකුණ යන පළාත් කාර්යාල වෙත ගෙනවිත් බාර දිය යුතුය.**

09. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2023 සහ කාණ්ඩ අංකයන්** පැහැදිලිව සඳහන් කළ යුතුය.

10. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, විගණිත මූල්‍ය වාර්ථා (පසුගිය වසර තුනක), (අදාළ වේ නම්) මෙබඳු ඇනවුම් ලබා සතුටුදායක ලෙස සැපයුම් හා සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි (මිලදී ගැනීමේ ඇනවුම් හෝ කොන්ත්‍රාත් පිටපත්) පිටපත් අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්කරුවන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි නොකෙරනු ඇත.

11. කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හෝ කලත්‍රයා හෝ ඔවුන්ගේ දරුවන් අයදුම්කරු / අයිතිකරුවන් / හවුල්කරුවන් හෝ අධ්‍යක්ෂකවරුන් වන ආයතන සැපයුම්කරු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබයි.

12. එක් එක් අයදුම්පත් ඇගයීමට ලක් කරන අතර, බැංකුව තීරණය කරන පරිදි සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය බැංකුව සතු වේ. සුදුසුකම් සම්පූර්ණ නොකළ අයදුම්කරුවන් වෙත ඒ බව ලිඛිත දන්වනු ලබයි.

වැඩි විස්තර අවශ්‍යනම් කළමනාකරු – ප්‍රසම්පාදන වෙත **අංක 011 2035454** යන දුරකථන අංකයට අමතා එම තොරතුරු ලබාගත හැකිය.


**ප්‍රධාන මානව සම්පත් නිලධාරී,**
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**නො. 933, නුවර පාර,**
**වෙදමුල්ල , කැලණිය.**
**දුරකථන අංක : 011 2035454**
**ෆැක්ස් : 011 2906883**